**මාධ්‍ය නිවේදනය**

2017 මාර්තු 22, කොළඹ

Good Food, Good Life

***මැගී නැවත වරක් සිය විශිෂ්ටත්වය පෙන්නුම් කරයි !***

*ස්ලිම් - නීල්සන් සම්මාන උළෙලේදී වැඩිම මනාපයෙන් වසරේ 'තාරුණ්‍යයේ ආහාර සන්නාමය' ලෙසින් තේරී පත්වේ*

නෙස්ලේ ලංකා සමාගමේ මැගී සන්නාමය මෙවර ස්ලිම් - නීල්සන් සම්මාන උළෙලේදී සිය විශිෂ්ටත්වය නැවත වරක් පෙන්නුම් කිරීමට සමත්වී සිටී. ඒ තාරුණ්‍යය නියෝජනය කරන ශ්‍රී ලාංකේය පාරිභෝගික පිරිසෙහි වැඩිම මනාපයෙන් 'වසරේ තාරුණ්‍යයේ ආහාර සන්නාමය' ලෙස සිව්වැනි වරටත් සම්මානයට පාත්‍ර වෙමිනි. මැගී සන්නාමය ස්ලිම් - නීල්සන් සම්මාන උළෙලේදී පිළිවෙලින් ඇගයීමට ලක්වූ පස් වැනි වර්ෂය වීමද තවත් සුවිශේෂී සිද්ධියකි. මැගී සන්නාමය කෙරෙහි පාරිභෝගිකයින් තබා තිබෙන විශ්වාසය සහ මැගී නිපැයුම් පෙළට අලුතින් එක්කරන ලද 'මැගී දයියා' කුකුල් මස් රසැති නූඩ්ල්ස් කෙරෙහි ඔවුන් දක්වන ළබැඳියාව මෙම සම්මානය හරහා මැනවින් පැහැදිලි වේ. මැගී දයියා නූඩ්ල්ස් හඳුන්වා දීමත් සමග ශ්‍රී ලාංකීය තරුණ පරපුර මැගී නිපැයුම් පෙළ සමග පැවැති සබඳතාවය තවත් නැවුම් වී ඇත.

මැගී දයියා, කුකුල් මස් රසැති නූඩ්ල්ස් තරුණ පිරිස ප්‍රිය කරන තුනපහ ඇතුලත් රස පරාසයකින් සමන්විත වේ. කැල්සියම් පෝෂණයෙන් පරිපූර්ණ මැගී දයියා නූඩ්ල්ස්වල අඩංගු කුළු බඩු එහි රසය තවත් ඉහළ නංවා තිබේ.

නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය සභාපති - ආහාර නිපැයුම් - ප්‍රියදර්ශිනී කරුණාරත්න මෙම ජයග්‍රහණය පිළිබඳව සිය අදහස් මෙසේ දක්වා සිටියාය. ''මෙම ජයග්‍රහණය පිළිබඳව අපට කිසිදු සැකයක් තිබුණේ නැහැ. පාරිභෝගිකයින් හැමදාමත් අපේ හදවතේ සිටියා. අපගේ නිපැයුම් සඳහා අප සිදුකරන සෑම නව්‍යකරණයක්ම ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවයන් අනුව කිරීමට අපි සෑම විටම වග බලා ගන්නවා. ඔවුන්ගේ අංක එකෙහි කැමැත්ත දිනූ සන්නාමය ලෙස වර්ෂ පහක් සම්මානයට පාත්‍ර වීමට හැකිවීම අපට විශාල ආඩම්බරයක්. අප කෙරෙහි තබා ඇති විශ්වාසය සහ අප වෙත ලබා දෙන සහයෝගය පිළිබඳව අපගේ පාරිභෝගික පිරිස වෙත හෘදයාංගම ස්තුතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කරගන්නවා. මැගී නිපැයුම් පෙළෙහි කේන්ද්‍රස්ථානය වන්නේ අපගේ පාරිභෝගික පිරිසයි. එමෙන්ම ඔවුන්ගේ රස ගුණ පිරි සතුට ගෙදරදීම සාදාගත හැකි බව පසක් කර දීමටද අප ඉදිරියටත් කැපවීමෙන් කටයුතු කරන්නෙමු.''

මැගී, වර්ෂ 30කට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාවේ සෑම ගෘහයකම විශ්වාසය උපරිමයෙන් දිනාගත් සන්නාමයකි. දේශීය පාරිභෝගිකයාගේ කැමැත්ත සහ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මැගී නිපැයුම් පෙළ තවත් ව්‍යාප්ත කිරීමට සහ නව්‍යකරණයන්ට ලක් කිරීමට නෙස්ලේ ලංකා සමාගම පසුගිය වර්ෂ කිහිපය තුළ කටයුතු කර තිබේ. විශිෂ්ට පෝෂණයකින් සිය නිෂ්පාදන පරිපූර්ණ කිරීම සඳහා නෙස්ලේ ලංකා සමාගම සෑම විටම උපරිම අවධානයක් ලබා දෙනු ලබයි. ඒ අනුව යමින් මැගී නූඩ්ල්ස් පෙළට දේශීය රසය වැඩි වශයෙන් ලබා දෙමින් කහ, සාදික්කා, කොත්තමල්ලි, දුරු සහ කරදමුංගු සාරය එක්කරන්නට නෙස්ලේ සමාගම කටයුතු කළ අතර රටේ පවතින ක්ෂුද්‍ර පෝෂණ ඌණතාවය මග හැරවීමේ පිළියමක් වශයෙන් විටමින් A සහ කැල්සියම් පෝෂණයෙන් පරිපූර්ණ කිරීමටද කටයුතු කර තිබේ.

දේශීය වශයෙන් සාර්ථකව ව්‍යාපාරික මෙහෙයුම් සිදුකිරීමත් සමඟ අපගේ ගෝලීය සමීක්ෂණ සහ සංවර්ධන (*R&D*) භාවිතා අපගේ ශක්තිය වනවා. ශ්‍රී ලංකාවේ දේශීය බහුජාතික සමාගම වශයෙන් විරුදාවලිය ලද නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් සමග තිබෙන සබඳතාවය මේ වන විට වර්ෂ 110කටත් වැඩියි. අපගේ පාරිභෝගිකයින් විසින් ඔවුන්ගේ අංක එකෙහි ආහාර සන්නාමය වශයෙන් අපව තෝරා ගැනීම පිළිබඳ අපට ඉතාමත් සතුටුයි. පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා මැනවින් තේරුම් ගනිමින් අපගේ නිෂ්පාදනවල අගය ඉහළ නැංවීමට අප කටයුතු කරනවා. රටේ පවතින ක්ෂුද්‍ර පෝෂක ඌණතාවන්ට අපගේ නිෂ්පාදනවල පෝෂණීය ගුණය හරහා පිළිතුරු ලබා දීමට අපි දායකත්වය ලබා දෙනවා. අපගේ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ආහාර වේල් සහ ජීවන විලාසිතාවන් පිළිබඳව දැනුවත් කරමින් ඔවුන්ගේ

ජීවන තත්ත්වයන් සවිබල ගැන්වීමට අපි කටයුතු කරන අතර ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නංවමින් සෞඛ්‍ය සම්පන්න අනාගතයක් සහතික කරදීමට අපි කටයුතු කරනවා.'' යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙම ජයග්‍රහණය පිළිබඳව සිය අදහස් දක්වා සිටියාය.

ස්ලිම් - නීල්සන් සම්මාන උළෙල ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන ප්‍රමුඛතම අලෙවිකරණ සම්මාන උළෙලයි. නීල්සන් සමීක්ෂණ ආයතනය විසින් නිර්මාණය කරනු ලබන ආකෘතිගත ප්‍රශ්නාවලියක් අනුව ශ්‍රී ලංකාව පුරා තෝරා ගනු ලබන වයස 15 - 60 අතර පාරිභෝගිකයින්ගෙන් ලබා ගන්නා අදහස් මත පදනම් වෙමින් සම්මාන ලාභීන් තෝරා ගැනීම මෙහිදී සිදු කෙරේ.

---

**සංස්කාරක වෙත :**

නෙස්ලේ, ලොව විශාලතම ආහාර සහ රසවත් පානීය නිෂ්පාදන සමාගමයි. ලොව පුරා රටවල් 189ක නෙස්ලේ සමාගම සිය ව්‍යාපාර මෙහෙයුම් පවත්වාගෙන යයි. ලොව පුරා සේවයෙහි යෙදී සිටින නෙස්ලේ සමාගමේ සේවක පිරිස 328,000 ක් පමණ වන අතර පාරිභෝගික ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සෞඛ්‍යසම්පන්න අනාගතයක් නිර්මාණය කිරීම වෙනුවෙන් නෙස්ලේ සමාගම සතු දැක්ම යථාර්තයක් කරගැනීම සඳහා ඔවුහු කැපවී සිටිති. ලොව පුරා ජනතාව මෙන්ම සුරතල් සතුන් වෙනුවෙන් නෙස්ලේ සමාගම පුළුල් පරාසයක නිෂ්පාදන සහ සේවා රාශියක් ලබා දීම සිදුකරයි. නෙස්කැෆේ හෝ මැගී වැනි ජාත්‍යන්තර වශයෙන් ඉහළ පාරිභෝගික ආකර්ෂණයක් හිමි සන්නාමයන්හි මෙන්ම දේශීය පාරිභෝගික හදවත් වෙත ඉතාමත් සමීප වූ නෙස්ටමෝල්ට් සන්නාමය වැනි නිපැයුම් තෙක් පුළුල් පරාසයක පැතිරුණු 2000කට අධික සන්නාමයන් ප්‍රමාණයක් නෙස්ලේ සමාගම සතුය. පෝෂණය, සෞඛ්‍ය සහ යහගුණය නෙස්ලේ සමාගමේ කාර්යසාධනය ඉදිරියට ගෙන යාමේ ක්‍රමෝපායික පදනම වේ. නෙස්ලේ සමාගමේ ආරම්භක මූලස්ථානය ස්විට්සර්ලන්තයේ Vevey නගරය වන අතර වර්ෂ 150කට අධික ඉතිහාසයක් හිමි සමාගමකි.

නෙස්ලේ ලංකා සමාගම 1906 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාරික මෙහෙයුම් ආරම්භ කළ අතර එහි නිපැයුම්වලින් 90%ක්ම දේශීයව සිදු කරනු ලබයි. ඒ සඳහා වැඩි වශයෙන් දේශීය අමුද්‍රව්‍ය යොදාගැනීමටද නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි. කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් අතර වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් පළමු ස්ථාන හතරට අයත්ව සිටින නෙස්ලේ ලංකා සමාගම 25,000කට අධික ගොවීන් පිරිසකගේ ජීවනෝපාය පවත්වාගෙන යාම සඳහා සුවිසල් දායකත්වයක් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ අංක එකෙහි ආහාර සහ රසවත් පානීය නිපැයුම් සමාගම වශයෙන් නෙස්ලේ ලංකා සමාගම ඇගයීමටද ලක්වී ඇත (LMD වඩාත් ගෞරවනීය ව්‍යාපාරික ආයතන වර්ගීකරණය 2016).

වැඩි විස්තර සඳහා www.nestle.lk වෙත පිවිසෙන්න.




වමේ සිට දකුණට: රධිනි ඩි කොස්ටා, නියෝජ්‍ය උප සභාපති - අලෙවිකරණ සේවා, නෙස්ලේ ලංකා සමාගම; ප්‍රභාත් කරුණාරත්න, ප්‍රභේද කළමනාකරු - ආහාර, නෙස්ලේ ලංකා සමාගම; දීපාල් අබේසේකර, අලෙවිකරණ සහ මහජන සබඳතා ප්‍රධානී, මහජන බැංකුව; සමන්තා සමරවික්‍රම, නියෝජ්‍ය සන්නාම කළමනාකරු - ආහාර, නෙස්ලේ ලංකා සමාගම; නුවන් රත්නායක, සන්නාම කළමනාකරු - ආහාර, නෙස්ලේ ලංකා සමාගම; රමේෂා රණවීර, සන්නාම කළමනාකරු - ආහාර, නෙස්ලේ ලංකා සමාගම; ප්‍රියදර්ශිනී කරුණාරත්න - නියෝජ්‍ය සභාපති - ආහාර, නෙස්ලේ ලංකා සමාගම; රොෂාන් පෙරේරා - නියෝජ්‍ය උප සභාපති - නෙස්ලේ ප්‍රොෆෙෂනල්, නෙස්ලේ ලංකා සමාගම.






*නෙස්ලේ වෙළෙඳ සහ අලෙවිකරණ කණ්ඩායම සම්මානය අතැතිව*